# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2011 අංක 11 දරන ආර්ථික සේවා ගාස්තු (සංශෝධන) පනත

---

**[සහතිකය සටහන් කළේ 2011 මාර්තු මස 31 වැනි දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---


2011 අප්‍රේල් මස 01 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැක.

**මිළ : රු. 6.00 යි.** **තැපැල් ගාස්තුව : රු. 10.00 යි.**

**2011 අංක 11 දරන ආර්ථික සේවා ගාස්තු (සංශෝධන) පනත**

[සහතිකය සටහන් කළේ 2011 මාර්තු මස 31 වැනි දින]

එල්.ඩී.—ඕ. 11/2011.

**2006 අංක 13 දරන ආර්ථික සේවා ගාස්තු පනත සංශෝධනය කිරීම පිණිස වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

ලුහුඬු නාමය.

**1.** මේ පනත 2011 අංක 11 දරන ආර්ථික සේවා ගාස්තු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2006 අංක 13 දරන ආර්ථික සේවා ගාස්තු පනතේ 2 වන වගන්තිය සංශෝධනය කිරීම.

**2.** (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 2006 අංක 13 දරන ආර්ථික සේවා ගාස්තු පනතේ 2 වන වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) (2) වන උපවගන්තියේ (අ) සහ (ආ) ඡේද වෙනුවට පහත දැක්වෙන ඡේද ආදේශ කිරීමෙන්—

"(අ) 2007 මාර්තු මස 31 වන දිනට පෙර ආරම්භ වන අදාළ කාර්තුව සඳහා රුපියල් මිලියන දහය නොඉක්මවන අවස්ථාවල දී;

(ආ) 2007 අප්‍රේල් මස 1 වන දින හෝ ඊට පසු එහෙත් 2011 අප්‍රේල් මස 1 වන දිනට පෙර ආරම්භ වන අදාළ කාර්තුව සඳහා රුපියල් හත් මිලියන පන් ලක්ෂයක් නොඉක්මවන අවස්ථාවල දී;

(ඇ) 2011 අප්‍රේල් මස 1 වන දින හෝ ඊට පසු ආරම්භ වන අදාළ කාර්තුව සඳහා රුපියල් මිලියන විසිපහක් නොඉක්මවන අවස්ථාවල දී;" සහ

(2) එම වගන්තියේ (1) වන උපවගන්තියේ "උපලේඛනයේ" යන වචනය වෙනුවට අවස්ථාවෝචිත පරිදි "I වන උපලේඛනයේ " හෝ "II වන උපලේඛනයේ " යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය සංශෝධනය කිරීම.

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) එම වගන්තිය, එහි (1) වන උපවගන්තිය වශයෙන් නැවත අංකනය කිරීමෙන්;

(2) නැවත අංකනය කරන ලද (1) වන උපවගන්තියේ "7. යම් අදාළ කාර්තුවක් සඳහා" යන වචන සහ ඉලක්කම්

2—PL 005579—3,290 (2011/03)

වෙනුවට "7. 2011 මාර්තු මස 31 වන දින හෝ එදිනට පෙර අවසන් වන යම් අදාළ කාර්තුවක් සඳහා" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(3) නැවත අංකනය කරන ලද (1) වන උපවගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් උපවගන්තිය එකතු කිරීමෙන්:—

"(2) 2011 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසු ආරම්භ වන යම් අදාළ කාර්තුවක් සඳහා සේවා ගාස්තුව ගෙවිය යුතු සෑම තැනැත්තකු හා හවුල් ව්‍යාපාරයක් විසින්ම, තක්සේරුකරුවකු විසින් එසේ නියම කරනු ලැබුව ද, නොලැබුව ද, එක් එක් අවුරුද්දේ අප්‍රේල් මස විසිවන දින හෝ එදිනට පෙර එම වර්ෂයේ මාර්තු 31 වන දිනයෙන් අවසන් වන තක්සේරු වර්ෂය සඳහා, අවස්ථාවෝචිත පරිදි, එම තැනැත්තාගේ හෝ හවුල් ව්‍යාපාරයේ අදාළ පිරිවැටුම පිළිබඳව කොමසාරිස් - ජනරාල්වරයා විසින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි ආකෘතියෙන් සහ යම් විස්තර ඇතුළත් වාර්තාවක් තක්සේරුකරුවකු වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එම වාර්තාවේ, සේවා ගාස්තුව ගණන් බැලීමේ පදනම සහ කොමසාරිස්-ජනරාල්වරයා විසින් මේ වගන්තියට අදාළව නිශ්චිතව දක්වා ඇති අනෙකුත් විස්තර ද පෙන්නුම් කරනු ලැබිය යුතු ය."

ප්‍රධාන ප්‍රඥප්තියට 10අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ 10අ වගන්තිය ලෙස බලපැවැත්විය යුතු ය :—

ඉස්ලාමීය මූල්‍ය ගනුදෙනුවලින් ලැබෙන පිරිවැටුම සඳහා බදු අයකළ යුතු බව.

10අ. (1) යම් ඉස්ලාමීය මූල්‍ය ගණුදෙනුවක් පිළිබඳ යම් ව්‍යාපාරයකින් ලැබෙන පිරිවැටුම සඳහා මේ පනතේ විධිවිධාන ප්‍රකාරව බදු අයකරනු ලැබිය යුතු ය.

(2) යම් විශේෂිත ඉස්ලාමීය මූල්‍ය ගනුදෙනුවක් සඳහා යටත් වන බදු ප්‍රමාණය තීරණය කිරීමේ අරමුණින් දේශීය ආදායම් කොමසාරිස් - ජනරාල්වරයා විසින්—

(අ) යම් ඉස්ලාමීය මූල්‍ය ගනුදෙනුවකට බලපානු ලබන අවස්ථානුගත කරුණු හඳුනාගැනීමේ කාර්ය සඳහා; සහ

(ආ) යම් ඉස්ලාමීය මූල්‍ය ගනුදෙනුවකින් උපචිතවන ලාභ සහ ආදායම නිශ්චිතව දැනගැනීමේ කාර්ය සඳහා,

නියම කරනු ලැබිය හැකි රීති සහ මාර්ගෝපදේශ කලින් කල නිකුත් කරනු ලැබිය යුතු ය.”

**5.** ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තියේ “තැනැත්තා” යන යෙදුමේ අර්ථ නිරූපණය වෙනුවට පහත දැක්වෙන අර්ථ නිරූපණය ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තිය සංශෝධනය කිරීම.

“තැනැත්තා” යන්නට සමාගමක් හෝ පුද්ගල මණ්ඩලයක් ඇතුළත් වන නමුත්,-

(අ) ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 5 දරන සමුපකාර සමිති පනතේ අර්ථානුකූලව හෝ ලියාපදිංචිය සඳහා විධිවිධාන සලසමින් පළාත් සභාවක් මගින් පනවනු ලැබූ අදාළ යම් ප්‍රඥප්තියක් යටතේ ලියාපදිංචි කළ යම් සමිතියක්;

(ආ) ගුවන් යානයක හෝ නැවක අයිතිකරුවකු හෝ කුලියට ගත් තැනැත්තකු ලෙස ව්‍යාපාරික කටයුතු පවත්වාගෙන යනු ලබන යම් තැනැත්තකු;

(ඇ) 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ අර්ථ නිරූපණය කර ඇති යම් ආයතනයක් හෝ පළාත් පාලන ආයතනයක්;

(ඈ) යම් බෙදාහරින්නකු;

(ඉ) යම් ලොතරැයි වෙළෙන්දකු;

(ඊ) යම් ඒකක භාරයක් හෝ අන්‍යොන්‍ය අරමුදලක්;

ඊට ඇතුළත් නොවිය යුතු ය.”

ප්‍රධාන ප්‍රඥප්තියේ උපලේඛනය සංශෝධනය කිරීම.

**6.** ප්‍රධාන ප්‍රඥප්තියේ උපලේඛනය, පහත දැක්වෙන උපලේඛනය ආදේශ කිරීම මගින් සංශෝධනය කරනු ලැබේ:—

" I වන **උපලේඛනය**

2011 මාර්තු මස 31 වන දිනයෙන් අවසන්වන කාලය සඳහා"; සහ

ප්‍රධාන ප්‍රඥප්තියේ I වන උපලේඛනයට ඉක්බිතිවම අලුත් උපලේඛනයක් ඇතුළත් කිරීම.

**7.** ප්‍රධාන ප්‍රඥප්තියේ I වන උපලේඛනයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපලේඛනය ඇතුළත් කරනු ලබන අතර, එය එහි II වන උපලේඛනය ලෙස බලාත්මක විය යුතු ය:—

" II වන **උපලේඛනය**

2 වන වගන්තිය

2011 අප්‍රේල් මස 1 වන දින ආරම්භ වන කාලය සඳහා

| *යටත්වන පිරිවැටුමේ කොටස* | *එම කොටසට අදාළ වන සේවා ගාස්තු අනුප්‍රමාණය* |
|---|---|
| 1. ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය පනත අදාළ වන ව්‍යවසායයන් (ආදායම් බදු ගෙවීමට යටත්වන)- | |
| (අ) ඇඟලුම් අපනයනකරුවන්; | සියයට 0.1 |
| (ආ) ආයෝජන මණ්ඩල නිවාස; | සියයට 0.1 |
| (ඇ) ඇඟලුම් අපනයනකරුවන් සඳහා රෙදිපිළි නිෂ්පාදනය කරන නිෂ්පාදකයන්. | සියයට 0.1 |
| 2. නිදහස් කිරීම / සහන අනුප්‍රමාණ / වෙනත් දේ ප්‍රදානය කරන ලද තැනැත්තන්- | |
| (අ) ආදායම් බද්දෙන් නිදහස් තැනැත්තන්. (බදු විරාම සමාගම් ද ඇතුළුව); | සියයට 0.25 |
| (ආ) ඇතැම් කාලසීමාවන් තුළ පාඩු දරන තැනැත්තන්; | සියයට 0.25 |
| (ඇ) සහන අනුප්‍රමාණ යටතේ බදු ගෙවීමට යටත්වන තැනැත්තන්; | සියයට 0.25 |

| *යටත්වන පිරිවැටුමේ කොටස* | *එම කොටසට අදාළ වන සේවා ගාස්තු අනුප්‍රමාණය* |
|---|---|
| (ඈ) අලෙවිකරු විසින් නිෂ්පාදනය කරනු ලබන හෝ සාදනු ලබන නිෂ්පාදන හැර, තොග හෝ සිල්ලර වෙළඳාමේ නියැළී සිටින තැනැත්තන් (මෝටර් වාහන සහ මත්පැන් බෙදාහරින්නන් හෝ වෙළඳුන් හැර) | සියයට 0.25 |
| (ඉ) කපාපු පොල්, පොල් තෙල් සහ පොල් කෙඳි, කොප්පරා සහ ෂීට් රබර් ඇතුළුව, එහෙත් යම් මද්‍යසාර පාන වර්ග නිපදවනු ලබන යම් පරිවර්තනය කිරීම් හැර, තේ, රබර් හෝ පොල් වගාවන් මූලික වශයෙන් පරිවර්තනය කරනු ලබන තැනැත්තන්- | සියයට 0.25 |
| 3. ප්‍රචාරක නියෝජිතයන්- | |
| (අ) 2011 අප්‍රේල් මාසයට පෙරාතුව; | සියයට 1.0 |
| (ආ) 2011 අප්‍රේල් මාසයට පසුව. | සියයට 0.25 |
| 4. (මෝටර් වාහන, මත්පැන්, දුම්කොළ සහ ඛනිජ තෙල් අලෙවිකරුවන් ද ඇතුළුව,) ගැසට්පත්‍රයේ පළකරනු ලබන නිවේදනයේ පිරිවැටුම අර්ථ නිරූපනය කර ඇති වෙනත් ව්‍යාපාර." ඇතුළුව | සියයට 1.0 |

ඇතැම් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් බදු ගෙවීමෙන් නිදහස් කිරීම.

8. රුපියල් මිලියන සියය නොඉක්මවන වාර්ෂික පිරිවැටුමක් සහිත. යම් ව්‍යාපාරයක් කරගෙන යන යම් තැනැත්තකු හෝ හවුල් ව්‍යාපාරයක් විසින්, 2010 දෙසැම්බර් මස 31 වන දිනයෙන් හෝ ඊට පෙර අවසන් වන යම් තක්සේරු වර්ෂයක් සඳහා මේ පනත යටතේ ඔහු විසින් ගෙවිය යුතු ආර්ථික සේවා ගාස්තුව ගෙවීම යම් අර්බුදකාරී වාතාවරණයක් පැවතීම නිසා හෝ එවැනි යම් තැනැත්තකුගේ හෝ හවුල් ව්‍යාපාරයේ මුල්‍යමය ගැටලු පැවතීම හේතුවෙන් පැහැර හරිනු ලැබ ඇති විට දී, එවැනි යම් තැනැත්තකු හෝ හවුල් ව්‍යාපාරයක් මේ පනත යටතේ ගෙවීම පැහැර හැර ඇති ඒ ගාස්තුව ගෙවීමෙන් නිදහස් විය යුතු ය:

එසේ වුව ද, දේශීය ආදායම් කොමසාරිස් - ජනරාල්වරයා විසින්, ඒ සම්බන්ධයෙන් කරන ලද ඉල්ලීමක් මත, ගෙවීම පැහැර හැර ඇති ගාස්තුව සම්බන්ධයෙන් ඒ තැනැත්තා හෝ හවුල් ව්‍යාපාරය වෙත නිදහස් කිරීමේ සහතිකයක් නිකුත් කරනු ලැබිය යුතු ය:

එසේම තවදුරටත්, නිදහස් කිරීමේ සහතිකයක් නිකුත් කරන ලද්දේ යම් තැනැත්තකු හෝ හවුල් ව්‍යාපාරයක් වෙත ද, ඒ තැනැත්තා හෝ හවුල් ව්‍යාපාරය විසින්, 2011 ජනවාරි මස 1 වන දින හෝ එදිනට පසු ආරම්භවන යම් ඉදිරි තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන් මේ පනත යටතේ තමාට ගෙවීමට සිදු විය හැකි සියලු බදු ගෙවීම සඳහා වගකීමට බැඳෙන බවට වන ලිඛිත පොරොන්දුවක් ඊට සමගාමීව දේශීය ආදායම් කොමසාරිස් - ජනරාල්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**9.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 875 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළෙඹන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකි ය.